# මූලික අයිතිවාසිකම් පිළිබඳ ග්‍රාමීය ජනතාවගේ දැනුවත්භාවය පිළිබඳ අධ්‍යයනයක් (ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඹුල්ගොඩ ග්‍රාමය ඇසුරිනි.)

කේ.එම්.ඩී.චමිලා ප්‍රසාදි[1]

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් පිරිනමන ලද මූලික අයිතිවාසිකම් ලාංකික ජනතාවගේ පැවැත්ම සහ නිදහස තහවුරු කරලීම උදෙසා වැදගත් වේ. නමුදු ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාව තුළ මූලික අයිතිවාසිකම් පිළිබඳව ප්‍රමානවත් දැනුවත්භාවයක් පවතින්නේද යන්න ගැටලුවක්ව පවතී.මෙම අධ්‍යයනයේදී ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඹුල්ගොඩ ග්‍රාමීය ප්‍රදේශයෙන් 20% නියැදියක්තෝරා ගෙන, මූලික අයිතිවාසිකම් පිළිබඳ ග්‍රාමීය ජනතාවගේ දැනුවත්භාවයේ ස්වරූපය පිළිබඳව සොයා බලන ලදී. ඊට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් පිළිබඳ අධ්‍යයනය කිරීම සහ මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් ක්‍රියාත්මකවන ආයතනවල ක්‍රියාපටිපාටිය හඳුනාගැනීම ද මෙම අධ්‍යයනයේදී විමසන ලදී.විශේෂයෙන්ම ග්‍රාමීය ජනතාවගේ මූලික අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍ර මඟින් දත්ත රැස්කිරීම සිදුකළ අතර වගු, ප්‍රස්ථාර, යනාදී විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ දත්ත ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.මූලික අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට ඇතුළත් කළ පමණින්ම එම අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවයක් ග්‍රාමීය ජනතාව තුළ ඇති නොවන බව මූලික නිගමනය විය. නිදහස් පෞද්ගලික ජීවිතයක් ගතකිරීමට අවශ්‍ය හැකියාව පවාග්‍රාමීය ජනතාව තුළ නොවූ බව මෙහිදී හඳුනා ගත හැකි විය. මේ අනුව නියැදියෙහි 68% ක් මූලික අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවයකින් පසුනොවීය. ජනතාවට නිරන්තරව සමීප වන ජනමාධ්‍ය හරහා අයිතිවාසිකම් පිළිබඳ වැඩසටහන්, පුවත්පත් ලිපි, විවාද වැඩසටහන් සහ පාසල් විෂය ක්ෂේත්‍රය හරහා විධිමත් අධ්‍යාපනය තුළින්ද අවබෝධයක් ලබාදිය හැකිය. පොදු ජන සමාජයේ වටිනාකම්හි පරිහානි තත්ත්වය වළක්වා ගැනීමට අයිතිවාසිකම් වඩාත් හොඳින් තහවුරු කිරීම සඳහා අයිතිවාසිකම් පිළිබඳව කටයුතු කරන රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල දායකත්වයද කාර්යක්ෂම ලෙස ලබාගැනීම හරහා මෙම ගැටලුවට යම් ප්‍රමානයක විසඳුම් ලබාගත හැක.

**මුඛ්‍ය පද** : මූලික අයිතිවාසිකම්, ග්‍රාමීය ජනතාව, දැනුවත්භාවය

[1]සහකාර කථිකාචාර්ය , ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.prasahas@gmail.com